


සිසිර දිසානායක

# ''පොකමන්ලා'' ඇල්ලිල්ල

''මොබයිල් එකත් දික් කරගෙන තමුන්නැහේ ඔබ මොනවද හොයන්නේ ?'' පන්හිඳ වටරවුමක් මැද්දේ තමාගේ ජංගම දුරකතනයක් උළුක් කරගෙන මොනවද හොයන්න පින්සලගෙන් ඇහුවේ කෑ මොර දීලා. වටරවුම ඒ තරමට ම ලොකුයි. වාහන තද බදේත් ඒ තරමටම.

''මේ මනුස්සයා කොහොම පාර පැනගෙන ඔතෙන්ට ගියා ද මන්දා ?'' පන් තමන්ටම කියා ගත්තා.

''පොකමන් කෙනෙක්, පොකමන් කෙනෙක් අල්ලන්න ආවා....'' පින් වට රවුම මැද්දේ ඉඳගෙනම කෑ මොර දුන්නෙ තමන්ගෙ කාරිය කරන ගමන්. පින් වටරවුම මැද්දේ වටේට යනවා. හරියට මත් කුඩු උරපු කෙනෙක් වගේ.................

''මක් කිවවේා .?'' පන්ට පින් කියපු දේ තෝරුණේ නෑ.

''පොකමන්, පොකමන්, පස්සෙ කියන්නම්.''

''මොක වුණත් කමක් නෑ, පරිස්සමින් පාර පැනගෙනන ගෙදර එනවා........ පන් ගිරිය කැඩෙන්න හයියෙන් කෑ ගහලා කියලා ගෙදර එන්න හැරුණා.

''කිව්වා නාහන ගුරු ඉහළ ගියොත් ඉහයළ ගියාවේ, පහළ ගියොත් පහළ ගියාවේ.'' තමන්මට පන් කියාගත්තා.

පන් ගෙදර එනකොට පැන්සල වැඩ ඇරිලා ගෙදර ඇවිත් මූණ කට හෝදාගෙන මොකක් දෝ කියවනවා. පන්ට ඉස්පාසුවක් නෑ පින් වට රවුම මැද්දේ මොනවද කර කර හිටියේ කියලා දැනගන්න.

''අන්න අර මුනුස්සයා ''රවුන්ඩබවුට්'' එකක් මැද්දේ මොබයිල් එකක් දික් කරගෙන මොනවද කරනවා. පොලිසියෙන්වත් අල්ලාගෙන ගියෙ නැත්තං ඇති ත්‍රස්තයෙක් කියලා. අර හුඩ් එක තියෙන ජැකට් එකකුත් දාගෙන හරියටට ''ටෙරෙක්'' වගේ ....'' පන් කියාගෙන කියාගෙන ගියා.

''මේ කළුවරේ ? මේ මහ වැස්සේ ?
පන් නළල රැළි කරගත්තා.

''මං ඇහුවම ''පොකමන්'' ''පොකමන්'' කියලා මට කෑ ගැහුවා, මට විහිළු නමකුත් හදාගෙන ඒ ඩිංගට..'' පන්, පැන්ට නෝක්කාඩුව කිව්වේ හිතේ අමාරුවෙන්.

''ආං............. ''පොකමන්'' කියන්නේ තමුන්නැහේට දාපු ''නික් නේම්'' එකක් නෙවි. ''ගේම්'' එකක්. කොම්පියුටර් ගෙම් එකක්. මොබයිල් එකෙනුත් ප්ලේ කරන්න පුළුවන්.....''

''ඉතින් රවුන්ඩබවුඑක් එකක් මැද්දෙ මෙන එහෙකට ද ගේම් ප්ලේ කරන්නෙ ''?

''හොඳයි මං දන්න හරිය සහසුද්දෙන්ම කියන්නම්...... මා ගාවත් ඔය ඇප් එක තියෙනවා. මේං'' පන්හිඳ තමන්ගේ ''ස්මාර්ට්'' ජංගම දුරකතනය සාක්කුවෙන් එලියට ගත්තා.

''හෝව් හෝව් පොඩ්ඩක්......... මම පොඩි සටහනක් දාගන්නම්. සන්නසටවත් යවන්න පුළුවන්නේ. මං ඉතින් ලියන්නා නේ........''

''පොකමන්'' :ඡදනැපදබ* කියනනේ පරිඝණක ක්‍රීඩාවක්. අපේ බාසාවෙන් කිව්වොත් ''කම්පියුටර් ගේම'' එකක්. මීට අවුරුදු පහළොවකට විතර ඉස්සර මේ මෘදුකාංගය නැත්නම් සොෆ්ට් වෙයා ිදඑේ අ්රු* එක පරිඝණකයට ඇතුළත්කරගෙනයි ක්‍රීඩාව කලේ. පොකමන්ලා කියන්නේ මේ ක්‍රීඩාවට ඉන්න එක එක විදිහේ චරිත. මේ සමහර චරිත හරි වටිනවා. මේ අයව හොයන කොට නිතරම අපට මුණගැහෙන චරිත වැඩි අගයක් නෑ. නිතර දකින් නැති, දුර්ලභ, දුර ඉන්න අයව තමයි වැඩිය වටින්නෙ.'' පැන්සල මේ කියාගෙන යන්නේ පරිඝණක ක්‍රීඩාවක් ගැනද, නැත්නං ඇත්තටම අපේ අය අතරේ ඉන්න අය ගැන ද කියලා පැටලෙනවා.

''මේ පොකමන් චරිතත් නිර්මාණ්‍ය කරලා තියෙන්නේ අපේ මානසිකත්වයට ගැලපෙන්න වගේ.'' පන්ට නිකමට කියවුණා.

''ඇත්ත, ඒකනේ මේ ගෙම්'එක මේ තරම් ජනප්‍රිය. පස්සෙ ඔය පොකමන් චරිත ඇඳපු කාඩ් :ක්රි* මුද්‍රණය කළා. ඔය කාඩ් එහෙම නැත්නම් පොකමන් පත් එකතු කිරිල්ල මීට අවුරුදු දචහයකට විතර කලින් හරි ජනප්‍රිය වෙලා තිබුණා අපේ ළමයි අතරේ.''

''ඒ කියන්නෙ හැම චරිතයකටම යම් කිසි රූපයක් නිර්මාණය කරලා තියෙනවා ?''

''ඔබ් ඒකත් හරියට අපි වගේ මම තමයි. අපිට හැඩ රුවක් තියෙනවා වගේ. එත් වෙනස තමයි එටකම චරිතය තියෙන පිරිසක් මමතියෙනවා. ඒ කියන්නේ එක වර්ගය සත්තු වගේ. ඒ වර්ගයේ හැඩ රුව වගේම ගති ගුණ. හැකියාවල් සමානයි. පැන් තමන්ගේ ජංගමයේ ''පොකමන් ඇප්'' එක නැත්නම් ''පොකමන්'' පහසුකම විවෘත කළා.

''ඒ දවස්වල කොම්පියටර් වලට සීමා වුණ හැම දෙයක්ම දැන් මොබයින් ෆෝන් එකෙන් කරන්න පහසුකම් තියෙනවා. ඉතින් පොකමන් ඇප් එක :ඡදනැපදබ"චව* නැත්නම් ''පොකමන්'' පහසුකම මොබයිල් එකට ඇතුල් කරගත්තට තමුන්ට කැමති වෙලාවට මේ සෙල්ලම මොබයිල් එකෙන් කරන්න පුළුවන්.

ඉස්සර වෙලාම පුංචි තිරයට එටන්නේ අවවාදයක්. අවට ඇති දේ ගැන අවධානයෙන් ක්‍රීඩාව කරන්න කියලයි ඒකෙන් කියවෙන්නෙ. ඊට පස්සෙ එන්නෙ එක එක විදිහේ පොකමන් චරිත වල හැඩ රුව පෙන්නන පින්තූර.

''ඉතින් අර යෝදයා අර රවුන්ඩබව්ට් එක මැද්දෙ මක් කරනවද ?'' පන් ඇහුවේ දොර දිහා බලාගෙන'' තාම නෑ නෙ............'' පන්ට ඉවසිල්ලක් නෑ.



''දැන් අළුත්ම පොකමන් ගේම් එක චන්ද්‍රිකා තාක්ෂණයත් එක්කත් සම්බන්ධ කරගෙනයි තියෙන්නෙ. පොකමන්ලා ඉන්න තැන් මොබයිල් එකෙන් පෙන්නනවා. අපිට තියෙන්නේ ඒ තැනට ගිහින් ඒ පොකමන් ව අල්ලාගෙන එකතු කරගෙනන් එක. අල්ලා ගන්න ජංගමය එතැනට උඩින් අල්ලලා බොත්තමක් ඔබන්නයි තියෙන්නේ. ඒ තැනට යන් පාර සිතියමකින් මොබයිල් එකේ පෙන්වනවා. හරියට ''ජී.පී.එස්.'' :ඨජී* එකකින් වගේ. අපි ඉන්න තැන ඉඳන් පොකමන් ඉන්න තැනට පාර පෙන්වන්නේ ''සැටලයිට්'' නැත්නම් චන්ද්‍රිකා සම්බන්ධ කරගෙන. පොකමන් ලා ඉන්න කාර්ඩ්ස් :ක්රි* එකතු කරපු කාලේ ගියා. රවුන්ඩබවුට් එක :සෘදමබ්ඉදමඑ* මැද්දෙ පොකමන් කෙනෙක් ඉන්නවා කියලා පින්ට එයාගෙ මොබයිල් එකෙන් පෙන්නනවා ඇති. දැන් ඉතින් මිනිහා ආපහු එන්නෙ ඔබ පොකමහන්ව අල්ලාගෙන තමයි.

''මෙන තරම් අනතුරුදායකද ඒ වගේ තැනකට පොකමන් කොනෙක්ව දාන එක ඇත්තටම ? මේ මනුස්සයා පිස්සුවෙන් වාගේ මොබයිල් එක දික්කරගෙන කැරකුණේ. පාර පැන්නෙත් ඔහොමද දන්නෑ.''

එක ජාතියේම පොකමන්ලා එකතු රකන කොට ඒකටත තෑගි විදියට ලැබෙන ''කැන්ඩි'' :ක්බාහ* එකතු කරලා වැඩි වටිනාකමක් තියෙන පොකමන් කෙනෙක්ව ගන්න පුළුවන් අර අඩු වටිනාකකම් තියෙන අයව කීප දෙනෙක් වෙනුවෙන්. ඒ නිසා එක වර්ගයේ පොකමන්ලා එකතු කරන එකේ වාසියක් තියෙනවා. වෙන වෙන වර්ග වල අය එකතු වුණාමෙ ඒක ගලහගෙන වැඩි වටිනාකම් තියෙන අයව ගන්න අමාරුයි.

''ඒ කතාවත් හරියට අපේ වගේ නේ. එක ජාතියේ කට්ටිය තමයි එකට එකතු වේනනේ. දැන්නම් ඔය ෆෝස් මුක් එකේ එහෙමත් ඒ වගේනේ. ඒ වගේම හැමෝම දඟලන්නේ කට්ටිය එකතු කරගන්න. ඒ අය දාන ''ලයික්'' එකතු කරගෙන ලොකු ප්‍රතිරූපයක් හදාගන්න.''

''සමහරුනම් තියෙන දේවල් බෙලන්නෙත් නැතිව ''ලයික්'' දානවා. යාළුවෝ තරහ වෙයි කියලා. අන්තිමට අම්මා - අප්පා මළාය කියලා පෝස්ට් කළත් දෙන්නෙම නැතිව ''ලයික්'' දාලා...''

''එකතු කරගත්ත පොකමන්ලා ගොන්න වැඩි වාටිනාකමක් ඇති පොකමන්ලා කීප දෙනෙකුට මාරු කරගන්නවා වගේ අපිටත් කරගන්න පුළුවන්නම් ඇත්තටම ? ඒකනම් මරු අදහස මොකද ? වැඩකට නැති යාළුවෝ ගොන්නක් ඉන්නවට වැඩිය තමන්ගේ දුක සැප බෙදා හදාගන්න පුළුවන්, කුහක කමක් නැතිව තමන්ගේ දේ අගය කරනන් පුළුවන් අවංකව තමන්ට හරි වැරැද්ද කියලා දෙන්න පුළුවන්, තමන්ගේ දැණුම වැඩි දියුණු කරලා තමන්ගේ දියුණුව හදලා දෙන්න පුළුවන් අය කීප දෙනෙක් ළඟින් හයිටට්යම මදැයි කියලා හිතෙනවා වෙන දේවල්වල හැටියට''. හැබැයි ඒ වැඩේටත් මුලින් අර නොවටිනා යාලුවෝ ඕන වෙනවා. ඒක අමතක කරන්න හොඳ නෑ.

''එහෙම තමයි පොකමන්ලත් එකතු කරන්නේ. ඒ ඒ වර්ගවලට ආවේනික චරිත ලක්ෂණ තියෙන අයව තමන්ට කැමති කැමති විදියටයි එකතු කරගන්නේ. ආ ''ජිම්'' :ඨසප* එකට ගිහින් අර විදියේ වටිනා අයව ගන්නත් පුළුවන්. හැබැයි ඒකට කැන්ඩි ඕන........ පැන් තව තවත් තමන් එකු කරගත්ත වටිනා පොකමන්ලාව පන්ට ජංගමයෙන් පෙන්නුවා.

''ඔබ මොනවා වුණත් කමක් නෑ''. තමං ඉන්න තැනකට ඔබ පොකමන්ලාව ගෙන්න ගන් පුළුවන් නං. මොබයිල් දික්කරගෙන ඔහේ ඇවිදින අවදානම තමුංට විතරක් යැ ? පන් තවමත් විටින් විට දොර දිහා බලනවා. ''අපේ මනුස්සයා තවර රවුන්ඩබවුට් එක මැද්දෙ ද දන්නෑ. මොන පොකමන්ලා එකතු කරගත්තත් පරිස්සමෙන් පාර පැනලා තමුන්ට ගෙදර එන්න වෙන්නෙ තනියෙං නේද කියලා සිහි තිබුණොත් ඇති ...''

කොහොමත් පොකමන්ලව අත අරින්නෙ සෙනග ගැවසෙන තැන්වලග ඒ වගේම මොබයිල් ෆෝන් එකේ වියදම් වෙන දත්ත, බැටරි වගේ දේවල් ?. මට පේන්නෙ මේක දැන් එක එක දේවල් විකුණාගන්න යොදාගන්නව වගේ. ආපන ශාලා...... සුපර් මාර්කට්............

එක පාරටම දොර අරින සද්දයක්............

''ඔය එන්නෙ ... ඇති යන්තං............ පන් දොරකඩින් ඇහැ අරන් ලොකු හුස්මක් හෙළුවා.

''ඔය අල්ලගන්න පොකමන්ලා දෙතුන් දෙනෙක් ඇඳලා දුන්නනං ''සන්නස'' පත්තරේටවත් යවන්න'' පන් පින්සනලට කිව්වේ ඔලොක්කුවට වගේ.

Alpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing

Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093